**රණවිරු සේවා අධිකාරිය - 2018**
-----------------------------------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

රණවිරු සේවා අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩුව

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 දෙසැම්බර් 23 දින රු.2,100,000 කට තක්සේරු කර ගිණුම්ගත කර තිබුණු මෝටර් වාහනයක් 2018 ජනවාරි 26 දින රු.1,373,000 ක මුදලකට විකුණා තිබුණු අතර එම වාහනයේ තක්සේරුගත වටිනාකම වෙනුවට රු.1,500,000 ක් වූ මුල් පිරිවැය පදනම් කරගෙන වත්කම අපහරණයෙන් වූ ලාභය ගණනය කර තිබුණි. ඒ හේතුවෙන් වත්කම් අපහරණ ලාභය රු.1,661,425 කින් වැඩිපුර දක්වා තිබුණු අතර මෝටර් වාහන ක්ෂය වෙන් කිරීම් රු.1,101,425 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට බලාපොරොත්තු වේ. | ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව ගිණුම්මය සටහන් තැබීමට අවශ්‍ය උපදෙස් ලබාදීමට අවශ්‍ය වේ. |

## 1.6 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| මු.රෙ.756 | ඉකුත් වර්ෂය සඳහා සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණය සම්බන්ධ වාර්තා 2018 මැයි 10 දින ඉදිරිපත් කර තිබුණු අතර එම වාර්තාවට අනුව ඒකක 31කට අදාල තොග විෂයයන් 170 ක ඌනතාවයක් සිදු වී තිබුණි. භාණ්ඩ සමීක්ෂණය | 2016/2017 භාණ්ඩ සමීක්ෂණයේ තිබූ ඌනතාවයන් සම්බන්ධයෙන් 2018 ඔක්තෝබර් 19 දින පැවති විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේදී භාණ්ඩ සමීක්ෂණය නැවත වරක් සිදුකර වාර්තාවක් ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවට අනුව එහි | අස්ථාන ගතවූ භාණ්ඩ සම්බන්ධ භාණ්ඩ සමීක්ෂණයට අදාල පසු පරීක්ෂා කටයුතු නොපමාව සිදුකර තොග පාලනය සම්බන්ධ අභ්‍යන්තර |

| | | | |
|---|---|---|---|
| | නැවත වරක් සිදුකර 2018 ඔක්තෝබර් 19 දින ඉදිරිපත් කර තිබූණු වාර්තාවට අනුව ඒකක 18 කට අදාල තොග විෂයයන් 68 ක් දක්වා එම ඌණතාවය අඩුවී තිබුණු නමුත් අස්ථානගතවූ භාණ්ඩ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග 2018 දෙසැම්බර් 31 දින වන තෙක් ගෙන නොතිබුණි. | ඌනතාවය ඒකක 18කට අදාළ තොග විෂයයන් 68 ක් දක්වා අඩු වී ඇත. මෙම ඌනතාවයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. | පාලන ක්‍රමවේද ශක්තිමත් කළ යුතු බව අවධාරණය කරනු ලැබේ. |
| 2002 මැයි 24 දිනැති අංක 21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රණවිරු සේවා අධිකාරිය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2016 හා 2017 වර්ෂයන්ට අදාල කාර්යසාධන වාර්තා 2018 දෙසැම්බර් 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2016 වාර්තාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා යොමු කර ඇත. අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසු ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික වාර්තා සභාගත කිරීමට කටයුතු කළ යුතු වේ. |
| මු.රෙ. 371 | කාර්යය නිමකල වහාම ලබාගත් අත්තිකාරම් මුදල් පියවිය යුතු වුවත් 2014 වර්ෂය තුලදී අධිකාරියේ නිලධාරින් දෙදෙනෙකුට අවස්ථා 5 කදී ලබා දී තිබුණු එකතුව රු.1,830,450 ක්වූ මුදල් අත්තිකාරම් 2018 දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විනය පරීක්ෂණය පිළිබද සෑහීමකට පත්විය නොහැකි බැවින් ආරක්ෂක රාජ්‍ය අමාත්‍යාංශය හරහා නැවත පරීක්ෂණය සිදු කිරීමට ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු වේ. මීට අමතරව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින්ද මේ පිලිබදව විමර්ෂණයක් සිදුකරගෙන යනු ලැබේ. | මුදල් අත්තිකාරම් ලබාදීම සඳහාවූ අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 22,447,903 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 61,412,678 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.38,964,775 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ පුනරාවර්තන වියදම් රු.50,680,390 කින් සීමා කර තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.11,715,616 කින් පහල ගොස් තිබුණු අතර සුපිරි වාසනා සම්පත ලොතරැයි මගින් ලැබු ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.8,952,118 කින් එනම් සියයට 17.2 කින් පහල ගොස් තිබීම මෙයට හේතුවී තිබුණි. එසේම ව්‍යාපෘති වියදම් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.32,113,180 කින් පහලයාම හා සැපයීම් සහ ගිවිසුම්ගත සේවාවන්ගේ පිරිවැය පිළිවෙලින් රු.3,153,507 හා රු.2,078,721 කින් පහලයාම ප්‍රධාන විචලනයන් වශයෙන් හදුනාගෙන තිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 ව්‍යාපෘති ප්‍රගතිය

පහත සදහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂ තුනක කාලය තුලදී රණවිරු සුභසාධනය සදහා අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණු සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩමුළු, වෛද්‍ය සායන සහ මනෝවිද්‍යාත්මක වැඩමුළු සමාලෝචිත වර්ෂය තුලදී ක්‍රියාත්මක කර නොතිබුණි. එසේම ආබාධිත රණවිරුවන් සදහා ශ්‍රව්‍ය හා දෘශ්‍ය උපකරණ, ස්වයං රැකියා හා ශිෂ්‍යාධාර ලබාදීමේ වැඩසටහන් වෙනුවෙන් දරා තිබුණු වියදම වාර්ෂිකව ක්‍රමයෙන් අඩුවී තිබුණු බව නිරීක්ෂණය විය. තවද රණවිරුවන්ගේ හා ඔවුන්ගේ පවුල් සම්බන්ධ සාමාජීය අවශ්‍යතාවයන් හදුනා ගැනීමට සහ ඒ සම්බන්ධව සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සදහා වැඩ පිළිවෙලක් නොවූ බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද රණවිරු සුභසාධන ව්‍යාපෘති සදහා දරන ලද වියදම හා අධිකාරියේ සාමාන්‍ය පරිපාලන වියදම සංසන්දනය කර පහත සටහනෙන් දැක්වේ.

| | 2018 | 2017 |
|---|---|---|
| | රු | රු |
| රණවිරු සුභසාධන වැඩසටහන් සදහාවූ වියදම් | 389,812,549 | 421,925,729 |
| සාමාන්‍ය පරිපාලන වියදම | 84,113,655 | 96,617,499 |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රත්‍යාගණන වටිනාකම රු.15,656,250 ක් වූ වර්ග අඩි 2887 ක් ප්‍රධාන කාර්යාලයීය ගොඩනැගිල්ලේ ඉහළ මහල 2012 වර්ෂයේ සිට ප්‍රයෝජනයට නොගෙන පැවති බව නිරීක්ෂණය විය. අධිකාරිය විසින් 2016 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන තිබුණු රු.42,138 ක් වටිනා පරිගණක මේස 06 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් භාවිතා නොකර නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. | ගොඩනැගිල්ලේ ඉහල මාලය 2019 ජූලි 01 දින සිට කාර්යාල කටයුතු සදහා යොදාගැනිමට හැකිවන පරිදි සකස් කිරීම් කටයුතු සිදුකරමින් පවතී. අධිකාරියේ අවශ්‍යතාවය මත ඉදිරියේදි එම පරිගණක මේස භාවිතයට ගැනීමට කටයුතු කර ඇත. | අධිකාරිය සතු භෞතික සම්පත් ඵලදායීව යොදා ගැනීමට පියවර ගත යුතුය. |

## 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රණවිරුවන් පිළිබඳ තොරතුරු පද්ධතියක් පවත්වා නොතිබීමත් අධිකාරිය විසින් ක්‍රියාත්මක කර තිබුණු සුභසාධන වැඩසටහන් පිළිබඳව අභ්‍යන්තර පාලන පද්ධතීන් ශක්තිමත් නොවීමත් හේතුවෙන් විවිධ වංචා සිදුවූ අවස්ථා හෙළිදරව් වී තිබුණි. රණවිරු මාපිය රැකවරණ දීමනා ක්‍රමය යටතේ එක් මවකට සහ පියෙකුට මාසිකව රු.750 බැගින් වූ දීමනාවක් පමණක් ගෙවිය හැකි වුවත් 2016 ජූනි මාසයේ සිට 2017 නොවැම්බර් මාසය දක්වා මාස 18 ක කාලය තුල එක් රාජ්‍ය බැංකුවකින් ගිණුම් හිමියන් දෙදෙනකු වෙත රු.5,941,500 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධව සිදුකරන ලද අභ්‍යන්තර පරීක්ෂණයේදී ඉහත වටිනාකම් සම්බන්ධයෙන් අක්‍රමිකතාවයක් සිදුවී තිබුණු බව තහවුරු වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට ඒ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම සඳහා නිර්දේශයන් කර තිබුණු බවත් නිරීක්ෂණය විය. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කොට ඇති අතර මේ වන විට එහි විමර්ෂණ කටයුතු සිදුකෙරෙමින් පවතී. | මෙවැනි කටයුතු නැවත සිදු නොවීමට පාලන පද්ධතිය විධිමත් කර සිදුවූ අලාභය අයකර ගැනීමට පියවර ගත යුතුය |

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල මහභාණ්ඩාගාරය වෙතින් වෙන්කර දී තිබුණු රු.1,500,000 ක ප්‍රාග්ධන ප්‍රතිපාදන නිශ්චිත කාර්යය සඳහා උපයෝජනය කර නොතිබුණි. | මෙම මුදල අධිකාරියේ ප්‍රධාන ගොඩනැගිල්ල සඳහා යෙදවීමට මුදල් ඇමතිතුමාගේ අනුමැතිය ලැබී තිබෙනුයේ 2018 ඔක්තෝබර් 08 වන අතර ජාතික අයවැය දෙපාර්මේන්තුවෙන් අරමුදල් නිදහස් කරනු ලැබුයේ 2018 නොවැම්බර් 19 වන දිනය. ඒ අනුව මුදල් නිසිපරිදි උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | අදාල අරමුණ හඳුනාගනිමින් කාර්යක්ෂමව මුදල් උපයෝජනය කල යුතුය. |

## 3.5 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරිය සඳහා වායුසමීකරණ පද්ධතියක අවශ්‍යතාව නිසි පරිදි ඇස්තමේන්තු කර වායු සමීකරණ යන්ත්‍ර මිලදී ගැනීමට කටයුතු නොකර කළමණාකරන මණ්ඩලයේ අනුමැතියක් මත කුලී පදනම මත වායු සමීකරණ යන්ත්‍ර ලබාගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මාස 09 ක කාලයක් තුල රු.2,057,442 ක් වැය කර තිබුණි. | අධිකාරිය සඳහා ස්ථිර වායුසමීකරණ පද්ධතියක් මිලදී ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවූ බැවින් කුලී පදනම මත ආයතනයකින් වායුසමීකරණ යන්ත්‍ර මිලදී ගැනීමට ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය හිමිවූ අතර ඒ සඳහා මිලියන 2 ක පමණ මුදලක් ගෙවීමට සිදුවී තිබුනි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වෙමින් විධිමත්ව ප්‍රසම්පාදන කටයුතු සිදුකල යුතුය. |

කුලී පදනම මත ලබා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1(ඇ) අනුව සුදුසුකම්ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා සාධාරණ සමාන අවස්ථාවන් ලබාදිය යුතු වුවත් මෙම ප්‍රසම්පාදනයට අදාලව එක් සැපයුම්කරුවෙකුගෙන් පමණක් මිල කැඳවීම නිසා වෙළෙඳපොළ අනෙකුත් තරඟකාරී සැපයුම්කාර ආයතන සඳහා සාධාරණ අවස්ථා ලබාදී නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 3.6 මානව සම්පත් කළමනාකරණය

---------------------------------------

අධිකාරියේ කාර්ය මණ්ඩල සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය සඳහා වූ තොරතුරු පහත සටහනෙන් දැක්වේ.

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | 2018 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක සංඛ්‍යාව | | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | | අනුයුක්ත කරනු ලැබූ හමුදා නිලධාරීන් සංඛ්‍යාව | සිවිල් නිලධාරීන් සංඛ්‍යාව | |
| විධායක | 20 | 8 | 21* | 9 |
| විධායක නොවන | 70 | 35 | 54 | 19 |
| | ----- | ----- | --------- | ------- |
| **එකතුව** | **90** | **43** | **75** | **28** |

- දරන්නාට පෞද්ගලික වන තනතුරු 06 ක් ද ඇතුලත් වේ.